
උපදෙස් පත්‍රිකා අංක 2013/04

# රබර් සඳහා පොහොර




ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය

# රබර් වගාව සඳහා පොහොර යෙදීම

රබර් වගාවේදී උපරිම වර්ධනයක් හා සරු අස්වැන්නක් සඳහා ශාකයේ අවශ්‍යතාවයට අනුව පොහොර යෙදීම අත්‍යාවශ්‍ය කරුණකි. ශාකයට අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ ප්‍රධාන වශයෙන් පසෙන් ලබාගන්නා අතර එම ප්‍රමාණයන් ප්‍රමාණවත් නොවන කල ඒවා බාහිරව ලබාදීම සිදු කරයි. පොහොර යෙදීම යනු ශාකයට අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ බාහිරව කෘත්‍රිම වශයෙන් ලබා දීමයි.

ශ්‍රී ලංකාවේ රබර් වගාකරන ප්‍රදේශ සැලකීමේදී අත්‍යාවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ වන නයිට්‍රජන් (N), පොස්පරස් (P), පොටෑසියම් (K) සහ මැග්නීසියම් (Mg) වල ප්‍රධාන වශයෙන් ඌනතාවයක් දක්නට ලැබේ. එබැවින් එම පෝෂ්‍ය පදාර්ථ අඩංගු පොහොර නිර්දේශිත ප්‍රමාණයන්ගෙන් සහ අනුපාතවලින් යෙදීම ඉතා වැදගත් වේ. රබර් වගාවේ දී භාවිතා කරන රසායනික පොහොර වර්ග හා ඒවායේ පෝෂක ප්‍රමාණය වගුව 1 හි දක්වා ඇත.

වගුව 1. *රබර් වගාව සඳහා යොදනු ලබන රසායනික පොහොර වර්ග*

| පොහොර | කෙටි යෙදුම | නයිට්‍රජන් (N) % | පොස්පරස් ($P_2O_5$) % | පොටෑසියම් ($K_2O$) % | මැග්නීසියම් (MgO) % |
|---|---|---|---|---|---|
| යූරියා | U | 46 | | | |
| සල්ෆේට් ඔෆ් ඇමෝනියා | SA | 21 | | | |
| ඩයි ඇමෝනියම් පොස්පේට් | DAP | 18 | 46.0 | | |
| ආනයනික රොක් පොස්පේට් | IRP | | 28.5 | | |
| එප්පාවල රොක් පොස්පේට් | ERP | | 30.0 | | |
| උසස් තත්වයේ එප්පාවල රොක් පොස්පේට් | HERP | | 38.5 | | |
| මියුරියේට් ඔෆ් පොටෑෂ් | MOP | | | 60 | |
| සල්පේට් ඔෆ් පොටෑෂ් | SOP | | | 48 | |
| ඩොලමයිට් | DOL | | | | 20 |
| කීසරයිට් | KIES | | | | 24 |
| කොමර්ෂල් එප්සම් සෝල්ට් | CES | | | | 16 |

**පොහොර මිශ්‍රණ තෝරා ගැනීම**

රබර් වගාව සඳහා N, P හා K අඩංගු පොහොර මිශ්‍රණයක් ලෙස ලබා දෙන අතර (වගුව 2 හා 3) Mg අඩංගු පොහොර ඊට අමතරව ලබා දිය යුතුය. අදාල පොහොර මිශ්‍රණය තෝරා ගත යුත්තේ ප්‍රදේශයේ ඇති පාංශු කාණ්ඩය අනුවයි.

- කාණ්ඩ I - K බහුලයි, Mg අඩුයි - K අඩු පොහොර මිශ්‍රණ
- කාණ්ඩ II - K අඩුයි, Mg බහුලයි - K වැඩි මිශ්‍රණ, Mg අවශ්‍ය නොවේ
- කාණ්ඩ III - K හා Mg අඩුයි - K වැඩි පොහොර මිශ්‍රණ

වගුව **2.** *රබර් වගා කරන ප්‍රදේශ සඳහා නිර්දේශිත පොහොර මිශ්‍රණ*

| පාංශු කාණ්ඩය | පාංශු ශ්‍රේණිය | දිස්ත්‍රික්කය | පොහොර මිශ්‍රණය[a] | |
|---|---|---|---|---|
| | | | ලපටි බද්ධ පැළ තවාන් සඳහා | ක්ෂේත්‍ර පැල සඳහා |
| I | පාරඹෙ | කුරුණෑගල, කෑගල්ල,මහනුවර | R/YB 13:17:6:3 | R/U 15:15:7<br>R/SA 9:12:4:2 |
| II | මාතලේ | මාතලේ | R/YB 13:16:16 | R/U 12:14:14<br>R/SA 9:11:11 |
| III | අගලවත්ත, බොරලු රත්නපුර,හෝමාගම | අනෙකුත් සියලු දිස්ත්‍රික්ක | R/YB 9:11:11:4 | R/U 12:14:14<br>R/SA 7:9:9:3 |
| IV | | බදුල්ල, මොණරාගල, අම්පාර, වවුනියා | R/YB 8:11:11:4 | R/SA 7:9:9:3 |

[a] R/YB - ලපටි බද්ධ පැල සඳහා වූ පොහොර R/U – යූරියා මත පදනම් වූ මිශ්‍රණ R/SA – සල්ෆේට් ඔෆ් ඇමෝනියා මත පදනම් වූ මිශ්‍රණ

වගුව **3.** *රබර් පොහොර මිශ්‍රණවල සංයුතිය*

| පොහොර මිශ්‍රණ | SA | Urea | DAP | ERP/ IRP[a] | MOP | SOP | KIE | CES | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| R/YB 13:17:6:3 | 31 | - | 38 | - | - | 13 | - | 18 | 100 |
| R/YB 13:16:16 | 32 | - | 35 | - | - | 33 | - | - | 100 |
| R/YB 9:11:11:4 | 23 | - | 25 | - | - | 23 | - | 29 | 100 |
| R/U 15:15:7 | - | 33 | - | 55 | 12 | - | - | - | 100 |
| R/U 12:14:14 | - | 26 | - | 50 | 24 | - | - | - | 100 |
| R/SA 9:12:4:2 | 43 | - | - | 42 | 7 | - | 8 | - | 100 |
| R/SA 9:11:11 | 43 | - | - | 39 | 18 | - | - | - | 100 |
| R/SA 7:9:9:3 | 36 | - | - | 33 | 15 | - | 16 | - | 100 |

### වගාව සඳහා පොහොර යෙදීම

#### යොදන ප්‍රමාණය

රබර් ගසට යෙදිය යුතු පොහොර ප්‍රමාණය ප්‍රධාන වශයෙන් රඳා පවතිනුයේ ගසේ වයස, පාංශු කාණ්ඩය හා යොදන පොහොර මිශ්‍රණය මත වේ.

අපරිණත හා පරිණත වගාවලට යෙදිය යුතු පොහොර ප්‍රමාණයන් පිළිවෙලින් වගු 4 සහ 5 හි දක්වා ඇත.

**වගුව 4.** *අපරිණත වගාව සඳහා පොහොර යෙදීම*

| වසර | යෙදීම වාර ගණන | ප්‍රමාණය (ග්‍රෑම්/ගසකට/වසරකට) | | | |
|---|---|---|---|---|---|
| | | Urea මත පදනම් වූ | | SA මත පදනම් වූ | |
| | | කාණ්ඩ I & III | කාණ්ඩ II | කාණ්ඩ I & III | කාණ්ඩ II |
| පළමුවන | 04 | 275g R/U Mix. + 75/50g[a] KIE | 275g R/U Mix. | 450g R/SA Mix. | 375g R/SA Mix. |
| දෙවන | 04 | 550g R/U Mix. + 150/75g[a] DOL[b] | 550g R/U Mix. | 900g R/SA Mix. | 750g R/SA Mix. |
| තෙවන | 03 | 800g R/U Mix. + 200/100g[a] DOL[b] | 800g R/U Mix. | 1350g R/SA Mix. | 1125g R/SA Mix. |
| සිව්වන | 03 | 800g R/U Mix. + 200/100g[a] DOL[b] | 800g R/U Mix. | 1350g R/SA Mix. | 1125g R/SA Mix. |
| පස්වන සිට කිරි කපන තෙක් | 03 | 1100g R/U Mix. + 250/150g[a] DOL[b] | 1100g R/U Mix. | 1800g R/SA Mix. | 1500g R/SA Mix. |

a වැඩි Mg ප්‍රමාණය III කාණ්ඩයේ පස් සඳහා ද අඩු Mg ප්‍රමාණය 1 කාණ්ඩයේ පස් සඳහාද වේ.

b පොහොර යෙදීමේදී ඩොලමයිට් සහ යූරියා මිශ්‍ර වනසේ නොයෙදිය යුතුය

**වගුව 5.** *සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල අපරිණත වගාව සඳහා පොහොර යෙදීම (තාවකාලික නිර්දේශය)*

| වසර | ප්‍රමාණය (ග්‍රෑම්/ගසකට/වසරකට) R/SA 7:9:9:3 | | |
|---|---|---|---|
| | යෙදීම වාර ගණන | | කාලය |
| පළමුවන | 3 | (i) 100g | දෙසැම්බර් මස අග (සිටුවා මාස 2 පසු) |
| | | (ii) 150g | මාර්තු අග |
| | | (iii) 200g | සැප්තැම්බර් අග |
| දෙවන | 3 | (i) 250g | දෙසැම්බර් අග |
| | | (ii) 300g | මාර්තු අග |
| | | (iii) 350g | සැප්තැම්බර් අග |
| තෙවන | 3 | (i) 400g | දෙසැම්බර් අග |
| | | (ii) 450g | මාර්තු අග |
| | | (iii) 500g | සැප්තැම්බර් අග |
| සිවුවන | 3 | (i) 400g | දෙසැම්බර් අග |
| | | (ii) 450g | මාර්තු අග |
| | | (iii) 500g | සැප්තැම්බර් අග |
| පස්වන | 3 | (i) 600g | දෙසැම්බර් අග |
| | | (ii) 600g | මාර්තු අග |
| | | (iii) 600g | සැප්තැම්බර් අග |

## පරිණත වගාව සඳහා පොහොර යෙදීම

පරිණත වගාව සඳහා පොහොර නිර්දේශ සිදු කරනුයේ භූමියට විශේෂිත ආකාරයටය. මෙය පත්‍ර හා පාංශු විශ්ලේෂණය මගින් පාංශු හා ශාක පෝෂ්‍යත්ව දෙපාර්තමේන්තුව මගින් වසර 3ට වරක් සිදු කරනු ලැබේ. එසේ නොමැති කුඩා රබර් වතු හිමියන්ට වගුව 6 සහ 7 හි සඳහන් ආකාරයට පොහොර යෙදීම සිදු කල හැක.

**වගුව 6.** *පරිණත වගාව සඳහා පොහොර යෙදීම (කුඩා රබර් වතු හිමියන් සඳහා)*

| ප්‍රදේශය | පොහොර | ප්‍රමාණය (ග්‍රෑම්/ගසකට/වසරකට) | |
|---|---|---|---|
| | | අලුත් පොත්ත | ලියලූ පොත්ත |
| කෑගල්ල, කුරුණෑගල මහනුවර | Urea | 200 | 150 |
| | ERP | 100 | - |
| | MOP | 100 | 75 |
| අනෙකුත් සියලු ප්‍රදේශ | Urea | 200 | 150 |
| | ERP | 100 | - |
| | MOP | 200 | 150 |

**වගුව 7.** *සාම්ප්‍රදායික නොවන ප්‍රදේශ වල පරිණත වගාව සඳහා පොහොර යෙදීම (තාවකාලික නිර්දේශය)*

| පොහොර | ප්‍රමාණය ග්‍රෑම්/ගසකට/වසරකට | |
|---|---|---|
| | අලුත් පොත්ත | ලියලූ පොත්ත |
| SA | 450 | 350 |
| ERP | 100 | - |
| MOP | 200 | 150 |

## පොහොර දැමිය යුතු නිවැරදි කාලය

- තද වැසි කාල මග හැරිය යුතුය - පොහොර සේදී යා හැකි නිසා
- නියං කාල මග හැරිය යුතුය - මුල් පිළිස්සීම සහ අක්‍රමවත් උරා ගැනීම නිසා
- පරිණත වගාව සඳහා දලු ලෑමෙන් මසකට පසු පොහොර යෙදිය යුතුය.
- තෙත් කලාපයේ දී නම් ජුනි මාසයට පෙර පොහොර යෙදීම අවසන් කළ යුතුය

## පොහොර දැමීමේ නිවැරදි ක්‍රමය

- පොහොර දැමීමට පෙර ගස වටා අඩි 3 - 4 අරයක් සහිත වට ප්‍රමාණයක් වල් මර්ධනය කළ යුතුය
- මුල්ලු කිරීම මගින් පස තුලට පොහොර යෙදිය යුතුය. කිසි විටෙකත් පස මත පොහොර විසිර වීම සිදු නොකළ යුතුය.
- පැළ සිටුවීමෙන් පසු මුල් අවුරුද්ද තුලදී ගසේ මුල සිට අඩි 1ක් දුරින් වලයක ආකාරයට මුල්ලු කිරීමක් සමග පොහොර යෙදිය යුතුය

- වලයේ අරය ගසේ වයස සමග ක්‍රමයෙන් අඩි 3 - 4 දක්වා වැඩි කළ යුතු අතර පරිණත වගාව වන විට ගස වටා ස්ථාන 3කට හෝ 4කට පමණක් පොහොර යෙදීම ප්‍රමාණවත් වනු ඇත.
- යූරියා පොහොර හා ඩොලමයිට් යෙදීම අතර කාල පරාසය අවම වශයෙන් මාසයක්වත් විය යුතුය. එසේ නොමැති නම් ගස වටා වෙනත් ස්ථාන දෙකකට යෙදීමට වග බලා ගත යුතුය.
- වසුන් ද්‍රව්‍ය යොදන්නේ නම් පොහොර දැමීමෙන් පසුව එය කළ යුතුය.
- කේෂ්ත්‍රය අවටින් ලබා ගත හැකි වසුන් ද්‍රව්‍ය (පිදුරු, කොළ අතු වැනි දෑ) ගස වටා වලයක ආකාරයට යෙදීම ශාකයේ වර්ධනයට මනා පිටුවහලක් වනු ඇත.

RRIC 102 ක්ලෝනය Mg පෝෂකය සඳහා වැඩි කැමැත්තක් දක්වන බැවින් ක්ෂේත්‍රයේ සිටුවා ඇති පැල සඳහා නියමිත පොහොර ප්‍රමාණයට අමතරව 25% වැඩිපුර Mg පෝෂකය අන්තර්ගත පොහොර යෙදීම වඩා ප්‍රතිඵලදායී වනු ඇත.

### තවාන් සඳහා පොහොර යෙදීම

#### ළපටි බද්ධ තවාන් සඳහා පොහොර යෙදීම

මේ සඳහා නිර්දේශ කර ඇත්තේ 100% ජලයේ දියවන පොහොර පමණි. අදාල ප්‍රදේශයේ ළපටි බද්ධ තවාන් සඳහා තෝරා ගත යුතු පොහොර මිශ්‍රණ 2 වන වගුවේ ද එම මිශ්‍රණ වල සංයුතිය 3 වන වගුවේද දක්වා ඇති අතර යෙදිය යුතු පොහොර ප්‍රමාණයන් 8 වන වගුවේ ද දක්වා ඇත.

කාලයත් සමග දිය වූ පොහොර, භාජනයේ පතුලේ මණ්ඩි වශයෙන් තැන්පත් විය හැකි බැවින් පොහොර යොදන අවස්ථාවේදී නිතරම කැලතිය යුතුය.

**වගුව 8.** ***ළපටි බද්ධ පැළ සඳහා පොහොර යෙදීම***

| **යෙදිය යුතු කාලය** | **ප්‍රමාණය** |
|---|---|
| පොලිතීන් මලුව තුල<br>පැළ සිටුවීමට සති 2ට පෙර | HERP ග්‍රෑම් 50/බෑගයකට<br>කොම්පෝස්ට් ග්‍රෑම් 50/බෑගයකට |
| පැළ සිටුවීමෙන් සති දෙකකට පසු<br>පැළ කප්පාදු කරන තෙක් | අදාල R/YB මිශ්‍රණය ග්‍රෑම් 112 වතුර ලීටර් 4.5 දිය කරන්න<br>මි.ලී.100/බෑගයකට - සෑම සති 4 වරක් |
| පැළ කප්පාදු කිරීමෙන් පසු කේෂ්ත්‍රයේ පැළ සිටුවීමට සති දෙකකට පෙර දක්වා | අදාල R/YB මිශ්‍රණය ග්‍රෑම් 168 වතුර ලීටර් 4.5 දිය කරන්න<br>මි.ලී.100/බෑගයකට - සෑම සති 4 වරක් |

#### බද්ධ අතු තවාන් සඳහා පොහොර දැමීම

කේෂ්ත්‍රයේ සිටුවා ඇති පැළයකට පොහොර යොදන ආකාරයට සිදු කල යුතුය. යෙදිය යුතු ප්‍රමාණන් හා වාර ගණන 9 වගුවේ දක්වා ඇත. වසරකදී දෙවරක් කප්පාදු කිරීම සිදුකරන බැවින් අදාල පොහොර ප්‍රමාණයෙන් අඩක් බැගින් කප්පාදු කල විගස යෙදීම සිදු කෙරේ.

**කලින් තේ වගා කරන ලද ඉඩම් සඳහා පොහොර යෙදීම**

ශාක සඳහා පොහොර නිර්දේශය වගුව 4 හි ආකාරයට සිදු කල යුතු අතර නියමිත පොහොර ප්‍රමාණයට අමතරව එක් ගසක් සඳහා සිටුවා මාස 2කට පසු කීසරයිට් ග්‍රෑම් 25 ද සිටුවා මාස 14 කට පසු ඩොලමයිට් ග්‍රෑම් 50 ද යෙදීම සිදුකෙරේ.

වගුව 9. *බද්ධ අතු තවාන් සඳහා පොහොර යෙදීම*

| වසර | වාර ගණන වසරකට | ප්‍රමාණය | | | |
|---|---|---|---|---|---|
| | | **Urea** මත පදනම් වූ | | **SA** මත පදනම් වූ | |
| | | කාණ්ඩ **I & III** | කාණ්ඩ **II** | කාණ්ඩ **I & III** | කාණ්ඩ **II** |
| 1 | 4 | 275 R/U Mix. + 75/50 KIE | 275 R/U Mix. | 450 R/SA Mix. | 375 R/SA Mix. |
| 2 සිට ඉදිරියට | 2 | 550 R/U Mix. + 150/75[a] DOL[b] | 550 R/U Mix. | 900 R/SA Mix. | 750 R/SA Mix. |

a වැඩි Mg ප්‍රමාණය 111 කාණ්ඩයේ පස් සඳහා

b පොහොර යෙදීමේදී ඩොලමයිට් සහ යූරියා මිශ්‍ර වනසේ නොයෙදිය යුතුය

**ආවරණ වගා සඳහා පොහොර යෙදීම**

| | | |
|---|---|---|
| ආරම්භයේදී | - | ග්‍රෑම් 100/වර්ග මීටරයකට |
| පළමුවන හා දෙවන වසර | - | කි. ග්‍රෑම්100 - 200/හෙක්ටයාරයකට/වසරකට |

**තේ වගා කරන ලද ඉඩම්වල රබර් වගා කිරීමේදී පොහොර දැමිය යුතු පිළිවෙල**

සාමාන්‍ය පොහොර යෙදීමට අමතරව

| | | |
|---|---|---|
| සිටුවා මාස 2 පසු (පළමුවන වසර තුල) | - | කීසරයිට් ග්‍රෑම් 25/පැළයකට |
| සිටුවා මාස 14 පසු (දෙවන වසර තුල) | - | ඩොලමයිට් ග්‍රෑම් 50/පැළයකට |

**කාබනික පොහොර භාවිතය**

හැකි සෑම අවස්ථාවකදීම ඉහත නිර්දේශයන්ට අමතරව කාබනික පොහොර යෙදීම දිරිමත් කරනු ලැබේ. යෙදිය යුතු ප්‍රමාණයන් සඳහා දළ අදහසක් පහත වගුවෙන් ලබා ගත හැක (වගුව 10).

**වගුව 10.** *රබර් වගාව සඳහා කාබනික පොහොර යෙදීම*

| වයස | ප්‍රමාණය (කි.ග්‍රෑම්./ගසකට) | | |
|---|---|---|---|
| | පිදුරු/කොළ පොහොර | කොම්පෝස්ට්/ගොම පොහොර/කුකුළ් කූඩු ඇතුරුම් | * කුකුළ් පොහොර |
| සිටුවන වලවල් තුල | - | 3 | 2 |
| 1 වන අවුරුද්ද | 2 | 2 | 1 |
| 2 වන අවුරුද්ද | 3 | 3 | 2 |
| 3 වන අවුරුද්ද | 4 | 4 | 3 |
| 4 වන අවුරුද්ද | 4 | 4 | 3 |
| පස්වන සහ ඉදිරියට | 5 | 5 | 4 |

* සිටුවන වලවල් තුල සිටුවීමට සති 3 - 4 කට පෙර කුකුළ් පොහොර යෙදිය යුතුය

පාංශු හා ශාක පෝෂ්‍යත්ව දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය
ඩාර්ටන්ෆීල්ඩ්
අගලවත්ත

2014